www.agaram.lk

0074

OL/2017/12-S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ශෛවනෙරි I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** 'උලගෙලාමුනර්න් දෙද්වකරියවන්...' යන පෙරියපුරාණ ජේළියෙන් ප්‍රශංසා කරනු ලබන දෙවියන්,
(1) ශිව දෙවියන් ය. (2) නාරායනන් ය. (3) ආරුමුගන් ය. (4) නාන්මුගන් ය.

**2.** "ශිවනොඩු ඔක්කුම් දෙයිවම් තේඩිනුම් ඉල්ලෙ..." යනුවෙන් ගායනා කළ නායනාර්
(1) සේක්කිලාර් ය. (2) මානික්කවාසහර් ය. (3) තිරුමූලර් ය. (4) සේන්දනාර් ය.

**3.** අපගේ දෘශ්‍යමාන දෙවියන් වන්නේ,
(1) ශිව දෙවියන් හා පාර්වතී දේවියයි. (2) මව සහ පියා ය.
(3) විෂ්ණු දෙවියන් හා ලක්ෂ්මී දේවියයි. (4) මුරුගන් සහ වල්ලි ය.

**4.** පංචාංගයේ 'විත්තුතාල්' යනුවෙන් සඳහන් කරනු ලබන පිළිවෙත,
(1) ජීර්මංගලම් වේ. (2) ආවුද පූජාව වේ. (3) පොලි ශඩංගු වේ. (4) මුලෙප්පු ශඩංගු වේ.

**5.** මංගල චාරිත්‍රවල දී 'මනාල යුවල එකිනෙකාට අවස්ථාව ලබා දෙමින් ජීවත් විය යුතුයි' යන මතය ප්‍රකාශ කෙරෙනුයේ,
(1) මිරිස් ගල පෑගීම මගිනි. (2) මුද්ද සෙවීම මගිනි.
(3) මල් මාල මාරු කිරීම මගිනි. (4) තැල්ල බැඳීම මගිනි.

**6.** 'උලවාර පඩෛයාලි' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන නායනාර්,
(1) තිරුනාවුක්කරසර් ය. (2) සුන්දරමූර්ති නායනාර් ය.
(3) තිරුඥානසම්බන්තර් ය. (4) මානික්කවාසහර් ය.

**7.** ශිව දෙවියන්ගේ ශරීරයේ වම් කොටස ලබා ගැනීම සඳහා පාර්වතී දේවිය කළ උපවාසය,
(1) පංකුනි උත්තර උපවාසය වේ. (2) කේදාර ගෞරී උපවාසය වේ.
(3) කන්දශෂ්ටි උපවාසය වේ. (4) මාර්ගලි තිරුවාදිරෛ උපවාසය වේ.

**8.** දෙවියන්ගේ හිසෙහි තිබුණු ඇහැළ මල් මාලය පළඳවනු ලැබුයේ කාට ද?
(1) එරිපත්තර්ට ය. (2) එච්චතත්තන්ට ය. (3) කන්නප්පර්ට ය. (4) විසාරසරුමර්ට ය.

**9.** කාරෛක්කාල් අම්මයාර් ගැයූ ගීතිකා අඩංගු වී ඇති තිරුමුරෛ වන්නේ,
(1) 7 වැන්න ය. (2) 9 වැන්න ය. (3) 11 වැන්න ය. (4) 12 වැන්න ය.

**10.** ශෛව සන්ධානයේ ප්‍රමුඛයා,
(1) තිරුනන්දි දේවර් ය. (2) මෙයිකණ්ඩ දේවර් ය. (3) සනගර් ය. (4) සනාතනර් ය.

**11.** යාපනය, මඩකලපුව, වෙංකලඩි යන ස්ථානවල ශිව තොණ්ඩන් මධ්‍යස්ථාන පිහිටුවනු ලැබුවේ,
(1) කඩෛයිට් සුවාමිහල් විසිනි. (2) යෝගර් සුවාමිහල් විසිනි.
(3) සෙල්ලප්පා සුවාමිහල් විසිනි. (4) සෙල්ලදුරෛ සුවාමිහල් විසිනි.

[දෙවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**12.** දක්ෂිණායනයේ පළමුවැනි දිනයේ සමරනු ලබන උත්සවය,
(1) තෛපොංගල් ය. (2) දීපාවලි ය. (3) අලුත් අවුරුදු උදාව ය. (4) ආඩි පිරප්පු ය.

**13.** 'කන්මේන්ද්‍රියංගල්' යනුවෙන් සඳහන් වන්නේ මොනවා ද?
(1) නාදම්, වින්දු, සාදාක්‍යම්, ඊසුරම්, සුත්ත වින්තෛ
(2) කාලම්, නියදි, කලෛ, විත්තෛ, අරාගම්
(3) වාක්කු, වායු, පාණි, පාදම්, උපත්තම්
(4) රසය, එළිය, කරදර, ශබ්දය, සුවඳ

**14.** රාවණා හා ඔහුගේ මව වන්දනා කළ දේවාලය,
(1) තිරුකෝණේශ්වරම් ය. (2) මුන්නේශ්වරම් ය. (3) නගුලේශ්වරම් ය. (4) තිරුකේදීශ්වරම් ය.

**15.** දේව ආශිර්වාද පිළිබඳවත් එහි ප්‍රයෝජන පිළිබඳවත් පැහැදිලිව විස්තර කරන ශාස්ත්‍රීය ග්‍රන්ථය
(1) කොඩිකවි ය. (2) උන්මෛ විලක්කම් ය. (3) විනාවෙන්බා ය. (4) තිරුවරුට්පයන් ය.

**16.** දේවාලවල මහිමය පිළිබඳ විස්තර කරන ශ්‍රී ලංකාවේ රචිත පුරාණවලින් එකක් වන්නේ,
(1) තිරුකරසෛ පුරාණම් ය.
(2) ශිව පුරාණම් ය.
(3) ශිවරාත්‍රී පුරාණම් ය.
(4) ඒකාදසි පුරාණම් ය.

**17.** තිරුනාවුක්කරසර්ගේ ගීතිකා වර්ග,
(1) තුදු හා මාලෛමාටෘ වේ.
(2) තිරුවිරුත්තම් හා තිරුත්තාණ්ඩහම් වේ.
(3) තිරුවෙම්බාවෛ හා තිරුප්පාවෛ වේ.
(4) තිරුත්තොණ්ඩත්තොගෛ හා අන්තාදි වේ.

**18.** උට්පත්ති කාණ්ඩම් සිට තට්ස කාණ්ඩම් තෙක් කාණ්ඩ හයකින් යුත් පුරාණම්,
(1) කන්ද පුරාණම් වේ.
(2) පෙරිය පුරාණම් වේ.
(3) තිරුවාදවූරඩිහල් පුරාණම් වේ.
(4) තිරුවිලෛයාඩට් පුරාණම් වේ.

**19.** සරස්වතී දේවියගේ ආශිර්වාදය පතා කුමරගුරුබරර් විසින් ගායනා කරන ලද ගීතිකා,
(1) අභිරාමි අන්දාදි ය.
(2) සරස්වති අන්දාදි ය.
(3) මීනාට්චියම්මෛ පිල්ලෛ තමිල් ය.
(4) සකලකලාවල්ලි මාලෛ ය.

**20.** දෙවියන්ගේ පරික්කිරහ බලය ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) ආණවම් ය. (2) කන්මම් ය. (3) මායෛ ය. (4) තිරෝදායී ය.

**21.** ආගමික තීට්චෛ හා විශේෂ තීට්චෛ යන ඒවා ලබා ගත් අය අවසානයේ දී ලබා ගන්නා තීට්චෛ
(1) නයන තීට්චෛ වේ. (2) නිර්වාන තීට්චෛ වේ. (3) මානස තීට්චෛ වේ. (4) යෝග තීට්චෛ වේ.

**22.** ශ්‍රී ලංකාවේ ඇති දෙමළ බසින් ලියන ලද හින්දු ආගමික ග්‍රන්ථවලින් පැරණිතම ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,
(1) යාල්පාන වෛබවමාලෛ ය.
(2) පරරාසසේකරම් ය.
(3) සරසෝදි මාලෛ ය.
(4) සෙගරාසසේකර මාලෛ ය.

**23.** ශෛව විද්‍යා විරුත්ති සංගම් ආරම්භ කරනු ලැබූ වර්ෂය කුමක් ද?
(1) 1879 (2) 1902 (3) 1915 (4) 1924

**24.** ශ්‍රී ලංකාවේ ඒකාදසි පුරාණම් බිහි වූ කාලය කුමක් ද?
(1) අනුරාධපුර පාලන සමය
(2) පොළොන්නරු පාලන සමය
(3) ලන්දේසි පාලන සමය
(4) ඉංග්‍රීසි පාලන සමය

**25.** දේවාලවල දිනපතා කෙරෙන පූජාවල ඇති වන අඩුපාඩු මඟ හරවා ගැනීමට කරනු ලබන පිළිවෙත,
(1) කාමිග කිරියෛ වේ.
(2) ආන්මාර්ත කිරියෛ වේ.
(3) සායරට්චෛ වේ.
(4) නෛමිත්තිය කිරියෛ වේ.

**26.** දේවාල ගබඩා කාමර ලෙස ද රැකියා ලබා දෙන ස්ථාන ලෙස ද ණය ලබා දෙන බැංකු ලෙස ද පැවැති යුගය කුමක් ද?
(1) සංග යුගය (2) චෝළ යුගය (3) පල්ලව යුගය (4) නායක්කර් යුගය

**27.** ගොවියා තම රැකියාව ආරම්භයේ දී මුලින් කරනු ලබන්නේ,
(1) මුලෛප්පු ශඩංගු ය. (2) පොලි ශඩංගු ය. (3) ඒර්මංගල ශඩංගු ය. (4) ආයුධ පූජා ය.

**28.** "අන්නම් පාලික්කුම් තිල්ලෛ සිට්ට්‍රම්පලම්..." යන ගීතිකාව ගැයූ නායනාර්,
(1) තිරුඥාන සම්බන්තර් ය.
(2) තිරුනාවුක්කරසර් ය.
(3) මානික්කවාසහර් ය.
(4) සුන්දරමූර්ති නායනාර් ය.

[තුන්වැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk

www.agaram.lk



**29.** ශෛව දේවාලවල තිබෙන කොඩි ගසින් සංකේතවත් වන්නේ,
(1) දෙවියන් (පති) ය. (2) ආත්මය (පසු) ය. (3) ආණවම් ය. (4) මායෙයම් ය.

**30.** මඩකලපුවේ ශෛව බැතිමතුන් තම මිය ගිය අය වෙනුවෙන් කෙරෙන පිළිවෙත් (පිදිර්කඩන්) ඉෂ්ට කරන තීර්තම් වන්නේ,
(1) කීරිමලේ තීර්ත්තම් ය. (2) මෝදර තීර්ත්තම් ය. (3) මාමාංග තීර්ත්තම් ය. (4) විල්ලූන්ඩි තීර්ත්තම් ය.

**31.** 'වානවන් මාදේවීශ්වරම්' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) පළමුවැනි ශිව දේවාලය ය. (2) දෙවැනි ශිව දේවාලය ය.
(3) පස්වැනි ශිව දේවාලය ය. (4) තිරුත්තම්බලේශ්වරම් දේවාලය ය.

**32.** මුරුග දෙවියන් ඇදුරෙකු සේ වෙස්වලා ගෙන පැමිණ, දේශනා කළේ කුමන භක්තිකයාට ද?
(1) අභිරාමිපට්ටර්ට ය. (2) කච්චියප්පර්ට ය. (3) කාලිදාසර්ට ය. (4) අරුණගිරිනාදර්ට ය.

**33.** ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර්ගේ ප්‍රාථමික ගුරුවරුන්ගෙන් කෙනෙකු වන්නේ,
(1) කුමාරසාමි පුලවර් ය. (2) සින්නතම්බි පුලවර් ය.
(3) සරවනමුත්තු පුලවර් ය. (4) සභාපති පුලවර් ය.

**34.** පෙරියානෙකුට්ටි සුවාමිහල්ගේ සොහොන් ගෙය මත ස්ථාපිත කරනු ලැබූ ශිව දේවාලය වන්නේ,
(1) කොළඹ, මෝදර අරුණාචලේශ්වරර් දේවාලයයි. (2) කොළඹ පොන්නම්බලවානේශ්වරර් දේවාලයයි.
(3) රාමනාදේශ්වරර් දේවාලයයි. (4) නාවනාදේශ්වරර් දේවාලයයි.

**35.** වල්ලිපුරම් ආල්වාර් දේවාලයේ ප්‍රධාන කුටියේ තිබෙන්නේ,
(1) ශ්‍රී චක්‍රය ය. (2) සුදර්ශන චක්‍රය ය. (3) සාලක්කිරාමම් ය. (4) ගරුඩ ය.

**36.** සීතල උණ සුව කර භක්තිකයන් ආරක්ෂා කළ නායනාර්,
(1) තිරුඥාන සම්බන්තර් ය. (2) තිරුනාවුක්කරසර් ය.
(3) සන්ඩේස්වර නායනාර් ය. (4) සාක්කිය නායනාර් ය.

**37.** කොළඹ පොන්නම්බලවානේශ්වරර් දේවාලය කළුගල්වලින් නිර්මාණය කළේ,
(1) සර්. කන්දයියා වෛත්‍යනාදන් ය. (2) සර්. පොන්. රාමානදන් ය.
(3) සර්. පොන්. අරුණාසලම් ය. (4) කලායෝගි ආනන්ද කුමාරස්වාමි ය.

**38.** 'අභිෂේක කන්දන්' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන දෙවියන්,
(1) නල්ලූර් කන්දන් ය. (2) කතරගම කන්දන් ය.
(3) සෙල්වසන්නිදි කන්දන් ය. (4) මාවිට්ටපුර කන්දන් ය.

● පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

| ශෛව ආගමික කුරවර් | උපත ලැබූ ස්ථානය | හාස්කම් |
|---|---|---|
| A – තිරුඥාන සම්බන්තර් | D – තිරුවාමූර් | G – ගඩොල් කැට රන් කැට බවට පත් කිරීම |
| B – තිරුනාවුක්කරසර් | E – තිරුනාවලූර් | H – දේවාල දොර ස්වයංක්‍රීයව වැසීමට කටයුතු කිරීම |
| C – සුන්දරර් | F – සීර්ගාලි | I – ගල පාරුවක් සේ පාවීමට කටයුතු කිරීම |

**39.** තිරුත්තොණ්ඩත්තොගෙ ගායනා කළ අය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) ADI (2) BDH (3) CEG (4) CFG

**40.** 'දර්මසේනර්' යන විරුදනාමය ඇති ශෛව ආගමික කුරවර් හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AEI (2) BFG (3) CFH (4) BDI

* *

/හතරවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

OLD | 12 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

※ **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, දෙවන ප්‍රශ්නයට ලකුණු **16**ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු **8** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) කන්දපුරාණම් ග්‍රන්ථය දෙමළ බසින් රචනා කළේ කවුරුන් ද?

(ii) දෙවියන්ට සොරූභ තිලෛ, තඩත්ත තිලෛ යනුවෙන් ද්විවාර්ගික තත්ත්ව සඳහන් කරන දර්ශනය කුමක් ද?

(iii) 'දෙවියා එක් කෙනෙකි' යන්න මානික්කවාසහර් තිරුවාසහම් හි සඳහන් කරන්නේ කෙසේ ද?

(iv) 'පරාලෛ විනායහර් පල්ලු' යන ගීතිකාව ගායනා කළ අයගේ නම කුමක් ද?

(v) නාලායිරත් දිව්‍ය ප්‍රබන්ධය ගොනු කළේ කවුරුන් ද?

(vi) ශෛව නාට්පාදංගල් **දෙකක්** ලියන්න.

(vii) තිරුකෝදීශ්වරම් දේවාලයේ ඉතිහාසය පිළිබඳව දැන ගැනීමට උපකාරී වන පැරණිතම ග්‍රන්ථ **දෙකක්** සඳහන් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කන්නගි අම්මන් දේවාල **දෙකක** නම් සඳහන් කරන්න.

(ix) 'ආනා අරිවා අගලා අඩියවර්ක්කු වානාඩර් කාණාද මන්' මෙහි සඳහන් 'වානාඩර් කාණාද මන්' යන්නෙහි තේරුම කුමක් ද?

(x) 'විද්‍යාතත්තුවම්' වලින් **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකාවලින් **දෙකක්** නිවැරදිව හා නියම අනුපිළිවෙළට ලියන්න.

(ii) ඒවායේ තේරුම ලියන්න.

(අ) "වේයුරු තෝලිපංගන්... "

(ආ) "සංගනිදි පදුමනිදි... "

(ඉ) "තන්දදුන් රන්නෙක්... "

(ඊ) "අරුවමු මුරුවු මාගි..."

(උ) "මූවරෙන ඉරුවරෙන... "

**3.** "19 වන සියවසේ ශෛව ආගම හා දෙමළ භාෂාව වර්ධනය වීමට ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර් ඇඩි කැප කිරීමක් කළේ ය."

(i) ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර්ගේ ළමා කාලයේ නම කුමක් ද? ඔහු උපත ලැබුවේ කිනම් වර්ෂයේ ද?

(ii) නාවලර්තුමා විසින් ගැටපද විවරණ සහිතව ලියා මුද්‍රණය කර, ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ **තුනක්** සඳහන් කරන්න.

(iii) නාවලර්තුමාගේ සමාජ සේවා කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** "ආලයම් තොලුවදු සාලවුම් නන්ඩෘ."

(i) ශෛව ආගමික කුරවර්ලා විසින් ප්‍රශංසා කර ගායනය කරනු ලැබූ දේවාල කුමන නමින් හැඳින්වේ ද?
ආල්වාර්ලා විසින් ප්‍රශංසා කර ගායනය කරනු ලැබූ දේවාල කුමන නමින් හැඳින්වේ ද?

(ii) බැතිමතුන් වන්දනා ගමන් යාමට හේතු මොනවා ද?

(iii) ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ වන්දනා ගමන් කෙරෙන දේවාලවලින් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

[පස්වැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



5. "පෝදියා නිට්කුම් තිල්ලෛ පොදුනඩම් පෝට්ට්‍රි! පෝට්ට්‍රි!"
   (i) තිරුතොණ්ඩර් පුරාණම් හැඳින්වෙන අනෙක් නම කුමක් ද? එම ග්‍රන්ථය රචනා කළේ කවුරුන් ද?
   (ii) පෙරියපුරාණම් විස්තර කරන, ශිව දෙවියන්ගේ සිදම්බර නර්තනය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.
   (iii) පෙරියපුරාණම්හි විශේෂතා කෙටියෙන් පැහැදිලි කරන්න.

6. "ඔරුතිරු මුරුගන් වන්දාං ශුදිත්තනන් උලග මූයිය."
   (i) කන්දපුරාණම්හි, 'තිරුප්පෙරුවඩිවම්' ඇතුළත් වී ඇති කාණ්ඩයේ නම කුමක් ද?
   (ii) කන්දපුරාණම්වලින් කියැවෙන දාර්ශනික අදහස් මොනවා ද?
   (iii) මුරුග දෙවියන්ගේ වැදගත් උපවාසවලින් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
   (i) තිරුමුරෛ තොගුප්පු
   (ii) තෛපූසම්
   (iii) යෝගර් සුවාමිහල්
   (iv) ශෛව ආගමික සාරධර්ම
   (v) ග්‍රාමීය දේව වන්දනාව

* * *

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk